ඉන්දියානු මහ කොමසාරිස් කාර්යාලය

කොළඹ

***

**<u>පුවත්පත් නිවේදනය</u>**

## ඉන්දියාව කොවිඩ් වෛරස අර්බුදයට මුහුණ දෙන්නේ කෙසේද?

බිලියන 1.3ක ජනතාවක් වෙසෙන රටකට කොවිඩ් වසංගතයට මුහුණ දීමට දැඩි ප්‍රයත්නයක් දැරීමට සිදු වේ. අප්‍රේල් මස 16 වන දින වන විට ඉන්දියාවෙන් කොවිඩ් ආසාදිතයන් 12380ක්ද මරණ 414ක්ද වාර්තා විය. ඉන්දියාව වසා දැමීමට ගත් තීරණය මෑතකදී මැයි 3 දක්වා දීර්ඝ කෙරුණු නමුත් අප්‍රේල් 20 වන දිනෙන් පසුව කාර්මික, කෘෂිකාර්මික සහ ඒ ආශ්‍රිත ක්‍රියාකාරකම් අර්ධ වශයෙන් විවෘත කෙරෙනු ඇත.

මාර්තු 25 වන දින ඉන්දියාව වසා දැමීමට ගත් තීරණය ඓතිහාසික පියවරකි. උදාහරණයක් ලෙස මෙහිදී දුම්රිය මගී සේවාවන්ද නවතාලීමට තීරණය කෙරුණු අතර ඉන්දීය ජනරජ ඉතිහාසයේ එවන් පියවරක් ගනු ලැබුයේ ප්‍රථම වරටය. නමුත් මෙම ආරක්ෂක ක්‍රියාමාර්ග ඉන්දියාවට සිය යටිතල පහසුකම් සූදානම් කරගැනීමට ඉඩ සලසා දෙන ලදී. කොවිඩ් ආසාදිතයන් සඳහාම වෙන් කරන ලද රෝහල් 500කට වැඩි ප්‍රමාණයක්ද 5000කට වැඩි අමතර සෞඛ්‍ය පහසුකම්ද සූදානම් කර තිබේ. ඉන්දීය දුම්රිය සේවයද දුම්රිය මැදිරි හුදෙකලා මධ්‍යස්ථාන බවට පත් කරමින් හුදෙකලා ඇඳවල් 40000ක් ලබා දීමේ නව උපායමාර්ගයක් හඳුන්වා දී ඇත.

ඉන්දියාව වසා දැමීමට ගත් තීරණය නිසැකයෙන්ම ධනාත්මක ප්‍රතිඵල ලබා දී ඇත. රට වසා දැමීම සහ සමාජ දුරස්ථකරණය නොමැති වූයේ නම් අප්‍රේල් 15 වන දින වන විට ඉන්දියාවෙන් කොවිඩ් ආසාදිතයන් 820,000ක් දක්වා වාර්තා විය හැකිව තිබූ බව දත්ත වලින් පෙනී යයි. ඉන්දියාව වසා දැමීමත් සමඟ මේ වන විට කොවිඩ් ආසාදිතයන් 12,000ක් පමණ වාර්තා වී ඇත. වඩා වැදගත් වන්නේ එම ආසාදිතයන් විශාල වශයෙන් ස්ථානිකරණය වී තිබීමයි.

නමුත් රට වසා දැමීම කොවිඩ් වසංගතයේ බලපෑම පාලනය කිරීමට ඉන්දියාව ගත් පියවර අතරින් එකක් පමණි.

ක්‍රියාකාරී ස්වභාවයකින් ඉන්දියාව රට තුළ පළමු කොවිඩ් ආසාදිතයා වාර්තා වීමට සම්පූර්ණ දින 13කට පෙර එනම් ජනවාරි 17 වන දින සිට ගුවන්යානා පරීක්ෂණ කටයුතු ආරම්භ කළේය. ක්‍රමයෙන් ගුවන් මගීන් පරීක්ෂාව වැඩි කළ අතර සංචාරක සීමාද පනවන ලදී. අවසානයේදී සියලු ජාත්‍යන්තර ගුවන්ගමන් නවතා දැමීමට තීරණය කෙරිණ. වෛරස ව්‍යාප්තියේ පළමු අදියරට පැමිණීමටත් ප්‍රථමයෙන් කල් තියා සිදු කරන ලද මෙම පරීක්ෂා කිරීමේ කටයුතු හේතුවෙන් රටෙහි පද්ධතීන් වසංගතයට සූදානම් කිරීමේ අවස්ථාව ඉන්දියාවට හිමි විය.ලෝක සෞඛ්‍ය සංවිධානය සහ ජාත්‍යන්තර මූල්‍ය අරමුදල වැනි ජාත්‍යන්තර සංවිධාන ඉන්දියාව කල් තියා ගත් පියවර ක්‍රියාකාරී, ආරක්ෂාකාරී සහ ක්‍රමානුකූල බව ප්‍රකාශ කර ඇත.

රට වසා දැමෙන කාලය තුළ ඉන්දියානු රජය සහ කර්මාන්ත පෞද්ගලික ආරක්ෂක උපකරණ, ශ්වසන ආධාරක යන්ත්‍ර සහ පරීක්ෂණ කට්ටල ඇතුළු වෛද්‍ය උපකරණ නිෂ්පාදනය වේගවත් කළේය. පරීක්ෂා කිරීම් වැඩි කිරීම වෛරසය පැතිරීම පාලනය කිරීමට ගත හැකි වඩාත් සාර්ථක ක්‍රමවේදය බැවින් 2020 ජනවාරි මසදී 1ක් වූ ඉන්දියාවේ රසායනාගාර සංඛ්‍යාව මේ වන විට 223 දක්වා ඉහළ ගොස් ඇත.

ලෝකයේ විශාලතම ඖෂධ නිෂ්පාදකයකු වන ඉන්දියාව සිය ඖෂධ සැපයුම ඉහළ නැංවීම මගින් වැඩිවන ලෝක ඉල්ලුම සපුරාලීම සඳහාද සූදානම් විය. ඉන්දියාවේ ග්‍රාමීය ප්‍රදේශවල ස්වයං උපකාරක කාන්තා කණ්ඩායම් පවා මුහුණු ආවරණ, විශබීජනාශක දියර සහ ආරක්ෂක උපකරණ නිෂ්පාදනය කරමින් මෙම අභියෝගයට මුහුණ දීමට නැගී සිටියේය.

නමුත් මෙම රට වසා දැමීම පහසු කර්තව්‍යයක් නොවන අතරම එහි සමාජ ආර්ථික බලපෑම් නැතුවා නොවේ. රජයේ ප්‍රයත්නයන් හමුවේ වුවද විශේෂයෙන්ම උතුරු සහ බටහිර ඉන්දියාවේ නගර වලින් ප්‍රතිවර්ත සංක්‍රමණයන් නවතාලීමට නොහැකි විය. මෙම සංක්‍රමණ රැල්ල පාලනය කිරීමට රජය කර්මාන්ත සහ රාජ්‍ය නොවන සංවිධානයන්හි සහයෝගය ඇතිව මිලියන 1.25කට ආසන්න ජනතාවකට සහන සැලසීම සඳහා කඩිනමින් නවාතැන්, ආහාර කඳවුරු ගොඩ නගන ලදී.

තවත් අභියෝගයක් වන්නේ ආර්ථික වශයෙන් දුර්වල කණ්ඩායම් මත ඇතිවන බලපෑම සමනය කිරීමයි.මෙහිදී ඉන්දියාව එම ජනකොටස් වෙත ඍජුවම මුදල් බැර කිරීමට සිය පුළුල් බැංකු ජාලය සහ මාර්ගගත (online) පද්ධතීන් උපයෝගී කර ගන්නා ලදී. ගොවීන් සහ කම්කරුවන් ඇතුළු දුගී සහ දුර්වල කණ්ඩායම් වලට සහනයක් පිණිස ඇමරිකානු ඩොලර් බිලියන 22ක පැකේජයක් වෙන් කර ඇත. 220,000කට ආසන්න සෞඛ්‍ය සේවකයන්ගේ රෝග අවදානම අවම කිරීම සඳහා වෙනම රක්ෂණාවරණයක්ද හඳුන්වා දී ඇත.

රට වසා දැමීමේ තීරණය බල පැවැත්වෙන අතරතුර ප්‍රාන්ත සහ මධ්‍යම ආණ්ඩුව විදුලිය, ජලය, බලශක්තිය, ආහාර ද්‍රව්‍ය, බැංකු සේවා වැනි අත්‍යාවශ්‍ය සේවා අඛණ්ඩව පවත්වා ගෙන යන ලද අතර අසල්වැසි රටවලට අත්‍යාවශ්‍ය ද්‍රව්‍යයද සපයන ලදී. මාස තුනක කාලයක් සඳහා ධාන්‍ය වර්ග සහ පරිප්පු ලබා දීම මගින් මිලියන 800කට ආසන්න ජනතාවකට ආහාර සහනාධාර ලබා දෙනු ලැබේ.එසේම දුගී පවුල් මිලියන 80ක් සඳහා ගෑස් සිලින්ඩර නොමිලේ ලබා දෙනු ලැබේ.

නොයෙකුත් අභියෝග පැවතියත් ඉන්දීය ජනතාව මෙම රට වසා දැමීමේ තීරණයට ප්‍රතිචාර දැක්වන ලදී. සෞඛ්‍ය සේවකයන් අගය කිරීමට, අපේක්ෂාවේ පහන් දැල්වීමට සහ විශේෂයෙන්ම කොවිඩ්-19 වසංගතය විසින් නිර්මාණය කරන ලද අභියෝගයන්ට මුහුණ දීමට පිහිටුවන ලද PM CARES අරමුදලට දායකත්වය දැක්වීමට අග්‍රාමාත්‍ය නරේන්ද්‍ර මෝදි මැතිතුමා කරන ලද ඉල්ලීම් වලට ඉතා යහපත් ප්‍රතිචාරයක් හිමි විය.

කොවිඩ් වසංගතය යනු සැමට එක ලෙස ගැලපෙන සරල විසඳුමක් නොමැති ගෝලීය අභියෝගයක් බව හඳුනාගනිමින්, රජය සහ දේශීය ආණ්ඩු බිම් මට්ටමේ තත්වය පදනම් කරගෙන ප්‍රතිචාරය සකස් කිරීමට සහ ක්‍රියාවට නැංවීමට නායකත්වය ලබා දෙයි. මෙහි ප්‍රතිඵලයක් ලෙස රාජස්ථානයේ කේරළ සහ බිල්වාරා සහ ජම්මු සහ කාශ්මීරයේ ශ්‍රී නගර් නිවැරදි ක්‍රියාමාර්ග, නිසි සම්බන්ධීකරණය සහ දැඩි කාර්යක්ෂමතාව හරහා වෛරසය පැතිරීම සාර්ථකව පාලනය කළ ප්‍රදේශ බවට පත්ව ඇත.

ඉන්දියාව කොවිඩ් ආසාදිතයන් හා යම් ආකාරයකින් සම්බන්ධ වී ඇත්දැයි හඳුනාගැනීම සඳහාද නව්‍ය ක්‍රියාමාර්ග භාවිතා කරයි. ' ආරෝග්‍ය සේතු' යන යෙදවුම (app) මගින් පුද්ගලයකුගේ ස්මාර්ට් දුරකථනය හරහා ඔහු/ඇය රැඳී සිටි ස්ථාන භාවිතා කරමින් ඔහු/ඇය කොවිඩ් 19 ආසාදිතයකු ආසන්නයේ සිට ඇත්දැයි නිගමනය කෙරේ. මෙම යෙදවුම අප්‍රේල් මුලදී එළි දක්වන ලදී. මෙම යෙදවුම දැනට මිලියන 10කට අධික ප්‍රමාණයක් භාවිතා කරනු ලබයි. රට වසා දැමෙන කාලය තුළ ජනතාවගේ සෞඛ්‍යය ආරක්ෂා කිරීමටත් වෙනත් සුළු රෝගී තත්වයන්ගෙන් ආරක්ෂා වීමට ප්‍රතිශක්තිය වර්ධනය කිරීමටත් යෝගා ව්‍යායාම සහ ආයුර්වේදය ප්‍රචලිත කිරීමට පියවර ගෙන ඇත. මෙමගින් රටේ සෞඛ්‍ය යටිතල පහසුකම් මත ඇති වන පීඩනය ලිහිල් කෙරෙනු ඇත.

මෙම අර්බුදයට මුහුණ දීමට ඉන්දියාව දරන ප්‍රයත්නයන් ඉන්දියාවට පමණක් සීමා වී නැත. මාර්තු 15 වන දින වීඩියෝ තාක්ෂණය හරහා පවත්වන ලද අති විශේෂ සාක් නායක සමුළුවේදී අග්‍රාමාත්‍ය මෝදි මැතිතුමා

මේ සඳහා ගත හැකි පියවර මාලාවක් පිළිබඳව සඳහන් කළ අතර සෞඛ්‍ය ආධාර ලෙස ඇමරිකානු ඩොලර් මිලියන 10ක් දක්වා ලබා දෙන බවද ප්‍රකාශ කළේය. ඇමරිකානු ඩොලර් මිලියන 5ක දෙවනුවට වැඩිම ප්‍රදානය මෙම අරමුදලට ලබා දෙන බව ශ්‍රී ලංකාව නිවේදනය කළේය. පාකිස්ථානය ඇමරිකානු ඩොලර් මිලියන 3ක්ද, බංග්ලාදේශය ඇමරිකානු ඩොලර් මිලියන 1.5ක්ද, නේපාලය සහ ඇෆ්ගනිස්ථානය ඇමරිකානු ඩොලර් මිලියන 1 බැගින්ද මාලදිවයින ඇමරිකානු ඩොලර් 200,000ක්ද, භූතානය ඇමරිකානු ඩොලර් 100,000ක්ද ලබා දෙන බව ප්‍රකාශ කළේය.

කොවිඩ් වසංගතයේ බලපෑම් වලට සාමූහිකව මුහුණ දීම සඳහා මාර්තු 26 වන දින සාක් රටවල සෞඛ්‍ය ක්ෂේත්‍රයේ වෘත්තිකයන්ගේ සමුළුවක්ද අප්‍රේල් 8 වන දින වාණිජ ක්ෂේත්‍රයේ ජ්‍යෙෂ්ඨ වෘත්තිකයන්ගේ සමුළුවක්ද වීඩියෝ තාක්ෂණය ඔස්සේ පවත්වන ලදී.

දේශීය වශයෙන් පවතින සීමා හමුවේ වුවද ඉන්දියාව ලොව පුරා රටවල් 100කට අධික ප්‍රමාණයකට වෛද්‍ය සැපයුම් සහ සහයද ලබා දී ඇත. අප්‍රේල් 07 සහ 08 යන දෙදින ඉන්දියාව ශ්‍රී ලංකාවට ජීවිත සුරකින අත්‍යාවශ්‍ය ඖෂධ තොග දෙකක්ද පරිත්‍යාග කළේය.

කොළඹ

2020 අප්‍රේල් 16

*****